**ශීර්ෂය 102 - මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය**

------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 08 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, හෝ  අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස  අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය සඳහා සැලසුම් තළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිම එකතුව රු.මිලියන 5,893 ක් වුවද, එයින් රු.මිලියන 3,608 ක් පමණක් ඉල්ලුම් කිරීම නිසා එකතුව රු. මිලියන 2,285 ක් හෙවත් සියයට 39 ක් සැලසුම් කළ අග්‍රිමයට වඩා අඩුවෙන් ඉල්ලුම් කර තිබුණි. | සැලසුම් කළ පරිදි අග්‍රිමය ලබාගෙන අදාළ කාර්යයන් ඉටුකිරිමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | ව්‍යාපෘතිවලින් අපේක්ෂිත කාර්යසාධනය සිදුනොවීම හා අයවැය චක්‍රලේඛ මඟින් ප්‍රාග්ධන වියදම් සීමාකිරීම අග්‍රිම ඉල්ලුම් කිරීම අඩුවීමට හේතු වී ඇත. |
| (ආ) | සැලසුම් කල පරිදි අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා 2019 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් එකතුව රු. මිලියන 3,608 ක් අග්‍රිම වශයෙන් ඉල්ලුම්කර තිබුණද, භාණ්ඩාගාරය විසින් එකතුව රු. මිලියන 2,623 ක් පමණක් ලබාදීම නිසා එකතුව රු. මිලියන 985 ක් හෙවත් සියයට 27 ක් ඉල්ලුම්කල අග්‍රිමයට වඩා අඩුවෙන් ලැබී තිබුණි. | -එම- | නිරීක්ෂණය හා එකඟ වේ. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය ශීර්ෂය යටතේ වැය විෂයයන් 16 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.7,805,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | සැලසුම් කල පරිදි වියදම් ඉදිරිපත් නොවුණි. |
| (ආ) | වැය ශීර්ෂය යටතේ වැය විෂයයන් 24 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.2,936,980,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. 2,164,074,011 ක් ඉතිරි වී තිබුණි. එය ඉතිරිවීම් වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම හා නියමිත අක්මුදල් ලබාගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. | වර්ෂය තුළ ඇතිවූ අමාත්‍යාංශ ප්‍රතිශෝධනය, අයවැය චක්‍රලේඛ මඟින් වියදම් සීමා කිරීම නියමිත පරිදි අක්මුදල් නොලැබීම ප්‍රතිපාදන ඌන උපයෝජනයට හේතු වී තිබුණි. |
| (ඇ) | වැය ශීර්ෂය යටතේ රාජ්‍ය ආයතන 03 ක් වෙත ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා එකතුව රු. 52,000,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා දී තිබුණද, එම ආයතන විසින් එකී ප්‍රතිපාදන උපයෝජනය කිරීම් ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එකතුව රු. 48,177,270 ක හෙවත් සියයට 93 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. | නිරීක්ෂණ හා එකඟ වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2015 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් නියෝගයක් අනුව මූල්‍ය ආයතනයක තැන්පත්කරුවන්ට වන්දි ගෙවීම සඳහා 2019 වර්ෂයේදී එකතුව රු.1,055,000,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම ප්‍රතිපාදනයෙන් රු.355,100,000 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 ක් භාවිතා නොකර ඉතිරි වී තිබුණි. | සැලසුම්කල පරිදි අක්මුදල් ලබාගෙන, ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. | අවශ්‍ය පරිදි ප්‍රමාණවත් අක් මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබීම හේතු වී තිබුණි. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු රජයේ නිලධාරීන්ගේ වසරකට වැඩි ණය ශේෂවල එකතුව රු. 920,110 ක් විය. | හිඟ ණය සම්බන්ධව කටයුතු සොයා බලා නොපමාව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය. | අයකර ගැනීමට හැකියාවක් නොමැති ණය මු.රෙ. 113 අනුව අත්හැර දැමීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇති අතර නිලධාරීන් දෙදෙනෙකුගේ ණය මුදල් අය කර ගැනීමට උපදෙස් සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉතිරි ණය ශේෂ අයකරගැනීමට කටයුතු යොදා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය යටතේ දේශීය අරමුදල්/ විදේශ ණය/ආධාර යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 07 ක් සඳහා 2019 වර්ෂයේදී එකතුව රු.1,894,600,000 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා තිබුණද, එක් ව්‍යාපෘතියක් ආරම්භ නොකිරීම හා ඉතිරි ව්‍යාපෘති 06 හි කාර්යසාධනය මන්දගාමී ස්වරූපයක් ගැනීම හේතුවෙන් එකතුව රු. 1,364,677,667 ක් හෙවත් සියයට 72 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමේ අවශ්‍යතාවය | 2019 වර්ෂය තුලදී අමාත්‍යාංශය යටතේ පැවති ව්‍යාපෘතිවලින් එක් ව්‍යාපෘතියක් ආරම්භ නොවීමත්, ඉතිරි ව්‍යාපෘති 06 තුළින් අපේක්ෂිත මට්ටමෙන් වියදම් ඉදිරිපත් නොවීමත් ප්‍රධාන වශයෙන් මේ සඳහා බලපා තිබුණි. |

## 3.2 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රමාදනයන්

2011 අංක 23 දරණ බදු අභියාචනා කොමිෂන් සභා පනතින් බදු අභියාචනා කොමිෂන් සභාව ස්ථාපිත කර තිබුණ අතර යම් බද්දක්, ගාස්තුවක් හෝ දණ්ඩනයක් හා අදාළ කාරණාවක් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබාදෙනු ලබන යම් තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තෙකුට කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැක. එසේ ලැබෙන අභියාචනා කොමිෂන් සභාව විසින් විභාග කර නිශ්චය කිරීම කළ යුතුය. ඒ අනුව 2011 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ අභියාචනා සහ ඒවා නිශ්චය කිරීමට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව, 2011 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කොමිෂන් වෙත බදු අභියාචනා 923 ක් පමණ ලැබී තිබුණ අතර ඒවා අතරින් අභියාචනා 385 ක් පමණක් 2019 දෙසැම්බර් 31 දින වනවිට විභාග කර නිශ්චය කිරීම් ලබාදී තිබුණි. | බදු අභියාචනා විභාග කිරීම් කටයුතු කඩිනම් කිරීමේ අවශ්‍යතාවය | නිරීක්ෂණ හා එකඟ වේ. |
| (ආ) | විභාග කර නිශ්චය කිරීම් ලබාදුන් අභියාචනා 385 සඳහා තීන්දුව ලබාදීමට දින 365 සිට දින 2,920 අතර කාලයක් ගතවී තිබුණි. | -එම- | 2011 වර්ෂයේ සිට 2019 මාර්තු මස දක්වාම පැවතියේ එක් (01) කමිටුවක් පමණි. |
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා අභියාචනා කොමිෂන් සභාව වෙත ලැබී විභාග කිරීම් ආරම්භ කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානයටත් නිශ්චය ලබාදී නොමැති මතභේදාත්මක බදු මුදල හා දඩ මුදල රු. 24,699,101,553 ක් වූ අභියාචනා 177 ක් පැවතුණි. | -එම- | -එම- |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දින දක්වා අභියාචනා කොමිෂන් සභාව වෙත ලැබී එහෙත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අභියාචනා විභාග කිරීම් ආරම්භ කර නොතිබූ බදු අභියාචනා 361 ක් පැවතුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| (ඉ) 2013 අංක 20 දරන බදු අභියාචනා කොමිෂන් සභා සංශෝධන පනතේ 4.1 (අ) වගන්තිය ප්‍රකාරව ආපසු ගෙවනු නොලබන සියයට 10 කට සමාන මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාව විසින් තත්කාර්ය සඳහා විවෘත කරනු ලබන සහ පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට ගෙවන ලෙස දක්වා ඇත. ඒ අනුව, කොමිසමට බදු අභියාචනා භාර ගැනීමේදී අය කරන ලද සියයට 10 ක ආපසු නොගෙවන මුදල් තැන්පතු, බදු අභියාචනා විසඳා නිශ්චය ලබාදෙන තෙක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමෙහි රඳවා ගෙන ඇති අවස්ථා 21 ක වටිනාකම්වල එකතුව රු. 63,084,563 ක් වූ බව නිරීක්ෂණය විය. | ආපසු නොගෙවන සියයට 10 ක තැන්පතු මුදල කාලීනව රජයේ ආදායමට ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | විභාග කිරීම, අවසන් වනතුරු ස්වාධීන ගිණුමක රඳවා තැබීම සිදුකරනු ලබයි. |

**3.3 ප්‍රසම්පාදනයන්**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) 2019 අයවැය කථාව මුද්‍රණය කිරීම**

-------------------------------------

මුදල් අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේ අයවැය කථාව 2019 මාර්තු 05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනම ඇතුලත් වන පරිදි පිටපත් 1000 ක් මුද්‍රණය කරවාගැනීමට රු. 22,755,027 ක් (බදු සහිත) හා දත්ත ගබඩාකල CD 300 ක් හා දත්ත ගබඩා නොකල CD 200 ක් සපයාගැනීම සඳහා රු. 110,848 ක් (බදු සහිත) වශයෙන් මුළු එකතුව රු. 22,865,875 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) හා 4.3.2 ප්‍රකාරව සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කර එය | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) හා 4.3.2 ප්‍රකාරව පිරිවැය ඇස්තමේන්තු සැකසීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | අයවැය කථාවෙහි අඩංගු කරුණු, පිටු ප්‍රමාණය, යොදාගන්නා කඩදාසි, මුද්‍රිත ද්‍රව්‍ය හා මුද්‍රිත පිටපත් සංඛ්‍යාව පිළිබඳ තීරණ ගනු ලබන්නේ බොහෝවිට අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියේ අවසන් අවස්ථාවේදී වන බැවින් ඇස්තමේන්තුවක් සැකසීම ප්‍රායෝගිකව දුෂ්කර කාර්යයක් වේ. |

| | | | |
|---|---|---|---|
| | අදාල අධිකාරිය විසින් අනුමත කිරීම සිදුකල යුතු විය. එහෙත් ඉහත පොත් මුද්‍රණය සම්බන්ධව මිල ගණන් කැඳවීමට පෙර පිරිවැය අස්තමේන්තු සකස්කිරීමක් සිදු නොකරම කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කරන ලද මිල ගණන් වලට එකඟ වී තිබුණි. | | |
| (ii) | 2019 වර්ෂයට අදාල වූ අයවැය කථාව රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කරවා ගැනීම සඳහා වූ මිල විමසීම් සඳහා ඉදිරිපත්කර තිබූ මිල ගණන් අනුව එක් පොතක් සඳහා වැයවන මුදල බදු සහිතව රු.1,876 ක් නොඉක්මවන බව නිරීක්ෂණය විය. ඒ අනුව මුදල් රෙගුලාසි 632 ප්‍රකාරව මෙම මුද්‍රණ කටයුත්ත රජයේ මුද්‍රණාලයෙන් සිදුකරගත්තේ නම් එක් පොතක් සඳහා රු.20,879 ක මුදලක් බැගින් පිටපත් 1000 ක් සඳහා එකතුව රු.20,879,000 ක් වූ මුදලක් රජයට ඉතිරි කරගත හැකිව තිබුණි. | අඩු පිරිවැයක් යටතේ මුදල් රෙගුලාසි 632 ප්‍රකාරව රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කරවාගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | ඉතාමත් රහසිගතව, ඉතා කෙටි කාලයකින් මුද්‍රණය කරවා ගත යුතු රජයේ අයවැය කථාව රජයේ මුද්‍රණාලාධිපති ලවා කරවා ගැනීම ප්‍රායෝගිකව දුෂ්කර කාර්යයක් වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | වැයකරන ලද බදු සහිත එකතුව රු. 22,755,027 ක මුදල මුද්‍රණය කරන ලද පිටපත් සංඛ්‍යාව හා සැලකීමේදී එක් පිටපතක් සඳහා රු. 22,755 ක් වූ ඉතා අධික පිරිවැයක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. 2016 වර්ෂයේ පිටපතක් සඳහා වූ රු. 4,691 ක පිරිවැය හා සැසඳීමේදී 2017,2018 හා 2019 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 18,083 ක්, රු.20,628 ක් හා රු.18,064 ක් වශයෙන් පිටපතක පිරිවැයෙහි වැඩිවීම් සිදුවී තිබුණි. | වියදම් දැරීමේදී ශ්‍රී ලංකා රජයට වඩාත් වාසිදායක වන අයුරින් අවම පිරිවැයක් යටතේ සිදු කිරීමේ අවශ්‍යතාවය | අයවැය මුද්‍රණ පිරිවැය අඩුකරගැනීම සඳහා අනුගමනය කළහැකි පියවරක් වේ නම් ඒ සඳහා ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීම**

--------------------------------

මුදල් අමාත්‍යාංශයේ 2018 වාර්ෂික වාර්තාව සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන භාෂාත්‍රයෙන් පිටපත් 3,500 ක් මුද්‍රණය කිරීම සඳහා විවෘත මිල ගණන් කැඳවා ඒ අතරින් අවම මිල ලෙස රු. 2,900,100 ක (වැට් සහිත) ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනය තෝරාගෙන එම මුද්‍රණ කාර්යය සඳහා එකතුව රු. 3,011,880 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2006 භාණ්ඩ හා වැඩ සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) හා 4.3.2 අනුව සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කර මුළු පිරිවැය ඇස්තමේන්තුව අදාල ප්‍රසම්පාදන අධිකාරිය විසින් අනුමත කිරීම සිදුකල යුතු වුවත් එපරිදි පිරිවැය ඇස්තමේන්තු සකස්කර අනුමත කර නොතිබුණි. | 2006 භාණ්ඩ හා වැඩ සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමේ අවශ්‍යතාවය | නිරීක්ෂණය හා එකඟ වන බවත්, අතපසුවීමකින් පිරිවැය ඇස්තමේන්තු සකස්කිරීමට නොහැකි වූ බව හා 2019 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව මුද්‍රණ කටයුතු ආරම්භ කිරීමේදී පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමට සටහන් කරගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | කොන්ත්‍රාත්කරු විසින් මුද්‍රණය කර රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු වාර්ෂික වාර්තා පිටපත් ලද දිනයන් ඇතුලත්කොට භාණ්ඩ ලැබීම් පත්‍රිකා නිකුත් කර නිසිපරිදි ලේඛනගත කලයුතු වුවද එසේ සිදුකර නොතිබුණි. මුද්‍රණ කොන්ත්‍රාත්කරුගේ භාණ්ඩ බෙදා හැරීමේ නියෝග (Dispatch order) 10 කට අනුව පිටපත් 3485 ක් පමණක් ලැබී තිබුණු හෙයින් පිටපත් 15 ක් අඩුවෙන් ලැබී තිබුණු බව නිරීක්ෂණය විය. | භාණ්ඩ ලැබුණු විට භාණ්ඩ ලැබීම් පත්‍රිකා නිකුත්කර ලේඛනගත කිරීමේ අවශ්‍යතාවය | භාණ්ඩ ලැබීම් පත්‍රිකා නිකුත් නොකලද, භාරදෙන ලද ප්‍රමාණයන් හා භාරදුන් දිනයන් කොන්ත්‍රාත්කරුගේ බිල්පතෙහි දක්වා ඇත. |
| (iii) | එක් එක් භාෂාවෙන් මුද්‍රණය කලයුතු පිටපත් සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව භාෂාත්‍රයෙන් වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීමට තීරණය කර තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. විගණනයට ලබාදුන් තොරතුරු අනුව 2019 දෙසැම්බර් 31 දින වනවිට ඉතිරිව පැවති පිටපත් ප්‍රමාණය 418 ක් විය. | අවශ්‍ය පිටපත් සංඛ්‍යාව හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | 2019 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව 2020 මැයි අවසානයේ නිකුත් කරන තෙක් තවදුරටත් බෙදාහැරීමට අපේක්ෂා කරනු ලැබේ. |

**3.4 අවිධිමත් ගණුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 වර්ෂයේදී මුදල් අමාත්‍යවරයා සමඟ අමාත්‍යාංශය නිලධාරීන්/ අමාත්‍ය කාර්ය මණ්ඩලය විසින් විවිධ දේශීය උත්සව හා රැස්වීම් සඳහා සහභාගිවීමට යොදාගත් අභ්‍යන්තර ගුවන් සේවා සඳහා ගාස්තු ලෙස රු.9,101,453 ක් වැයකර තිබුණි. එහෙත් මහජන නියෝජිතයින්ට/ රජයේ නිලධාරීන්ට දේශීය ගමන් සඳහා ගුවන්සේවා යොදාගැනීම පිළිබඳව නිකුත් කරන ලද චක්‍රලේඛ හෝ | අමාත්‍යවරයා සමඟ අමාත්‍යාංශ නිලධාරීන්/ අමාත්‍ය කාර්ය මණ්ඩලයට ගුවන්සේවා යොදාගැනීම පිළිබඳව නිකුත් කරන ලද චක්‍රලේඛ හෝ උපදෙස් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය වී නොමැත. එබැවින් ඒ පිළිබඳව අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය | ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ කාර්යභාරය හා සැලසීමේදී දුර ගමන් සඳහා දිගු කාල වේලාවක් ගතවන මහාමාර්ග හරහා ගමන් කිරීම ප්‍රායෝගිකව දුෂ්කර කරුණකි. මෙම සංචාරයන් ඉතා හදිසි හා ඉතා අත්‍යාවශ්‍ය වීමත්, ගරු අමාත්‍යතුමා හා අනෙකුත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ හදිසි රාජකාරීමය තත්ත්වයන් සලකා ඉතා ඉක්මනින් කොළඹට පැමිණීම අත්‍යාවශ්‍ය බැවින්ද ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් උප සමාගමක් වන Helitours (Pvt) Ltd වෙතින් මෙම සංචාරයන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාගැනීමට ක්‍රියාකර ඇත. |

උපදෙස් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩාගාර පරිශ්‍රයේ සේවය කරන නිලධාරීන්ගේ හා සේවාලාභීන්ගේ ආරක්ෂාව සඳහා අමාත්‍යාංශය වෙත ලබාගෙන තිබුණු ගමන් මළු ස්කෑන් යන්ත්‍රයේ (Baggage Scanner) හා ශරීර පරීක්ෂණ (Body inspection) යන්ත්‍රයේ තාක්ෂණික ක්‍රියාකාරීත්වය ශරීරයට අහිතකර තත්ත්වයක් තිබේද යන්න පරීක්ෂා කර අදාල වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අමාත්‍යාංශය වෙත ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. එසේ වුවද, මෙම යන්ත්‍රය 2019 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මකව පවතී. | යන්ත්‍රවල තාක්ෂණික ක්‍රියාකාරීත්වය ශරීරයට අහිතකර තත්ත්වයක් තිබේද යන්න පරීක්ෂා කරවාගෙන අදාළ වාර්තාව කඩිනමින් ලබාගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | ශ්‍රී ලංකා පරමාණු බලශක්ති නියාමන සභාවෙන් අදාළ වාර්තාව මේ දක්වා ලැබී නොමැත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශයේ සමස්ථ කාර්ය මණ්ඩලයෙන් 81 ක් එනම් අනුමත සංඛ්‍යාවෙන් සියයට 20 ක් පුරප්පාඩුව පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 14 ක් විය. එය එහි අනුමත සේවක සංඛ්‍යාව හා සැසඳීමේදී සියයට 35 ක් පමණ විය. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම කාර්යසාධනයට අහිතකර ලෙස බලපායි නම් එම පුරප්පාඩු පිරවීම හෝ එලෙස බලපෑමක් ඇති නොවේ නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගැනීමේ අවශ්‍යතාවය | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කරන තෙක් වැඩබැලීමේ පදනම මත රාජකාරී ආවරණය කිරීම සිදුකරනු ලබන බවත් අමාත්‍යාංශයේ රාජකාරී කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා මෙම පුරප්පාඩු හැකි ඉක්මනින් සම්පූර්ණ කල යුතුව ඇත. |